# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 128 /2024 (PSC)**

ආර්.ඒ.අයි.ඒ. පෙරේරා,

ඩබ්.එල්.ඩී.එන්.විජේසුන්දර.

**අභියාචකවරු**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.01.07**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචකවරුන් වෙනුවෙන් නීතිඥ මහේෂ් රත්නායක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් අයි.වී.කලනි නයන්තිකා මිය.

**-<u>නියෝගය</u>-**

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචකවරුන් වන ආර්.ඒ.අයි.ඒ. පෙරේරා සහ බි.එල්.ඩී.එන්.විජේසුන්දර යන අයවළුන්, 2008.02.18 දින II ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් ලෙස රාජ්‍ය සේවයට එක්වී දැනට I ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් ලෙස සේවය කරනු ලබයි. වසර 17කට වැඩි කාලයක් අදාළ දෙපාර්තමේන්තුගත සේවා පළපුරුද්ද සහිත නිලධාරීන්ය. මෙම නිලධාරීන් දෙදෙනා 2024.07.18 දින මෙම අධිකාරයට අභියාචනක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ,

"**සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2021/2023 ට අදාළව, 2021.02.31 දිනට පවතින ඉතිරි පුරප්පාඩු 02 සඳහා 2023.11.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි අප දෙදෙනා හට සහකාර කම්කරු කොමසාරිස් III ශ්‍රේණියේ පත්වීම් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු.**"

අදාළ ඉල්ලීම සනාථ කිරීම සඳහා ඇමුණුම් සහ අදාළ ලිපි ලේඛන රැසක් මෙම අභියාචනය සමඟ සහ 2025.08.14 දින ලිඛිත දේශන සමඟ මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත. එයට අමතරව විවෘත අධිකරණයේ දී වාචිකව කරුණු දැක්වීම ද වැඩිදුරටත් සිදුකරන ලදි. අභියාචකයන්ගේ ප්‍රධාන තර්කය වන්නේ, 2021.03.31 දිනට ප්‍රසිද්ධ කරන ලද බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් පුරප්පාඩු ගණන 11 ලෙස සඳහන් වුවත් එය නිවැරදි නොවන බව සහ සත්‍ය වශයෙන්ම අදාළ දිනය වන විට තනතුරු 13ක් තිබූ බවත්, එසේම තනතුරු සඳහා බඳවා ගැනීමට ඉදිරිපත් කරන ලද 2023.01.23 දින දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුවද තනතුරු 13ක් සඳහන්ව ඇති බවත්, 2023.02.07 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුවත් ඒ සඳහා අනුමැතිය ලැබී ඇති බවද වැඩිදුරටත් ලේඛන සහිතව ඉදිරිපත් කර සිටී. මේ කරුණු දෙස බැලීමේ දී පැහැදිලිව විමසා බැලිය යුතු කරුණ වන්නේ, අදාළ දිනය වන විට කොපමණ පුරප්පාඩු සංඛ්‍යාවක් සත්‍ය ලෙසම තිබුණාද යන්නයි.

2021.03.31 දින ප්‍රසිද්ධ කරන ලද **2021/2023 සීමිත තරඟ විභාගය සහකාර කම්කරු කොමසාරිස් තනතුරු පිරවීම** යන දැන්වීමට අනුව, පුරප්පාඩු 11 පැවතුන බව සඳහන් කර ඇත. ඒ සැකසූ ආකාරයේ ඇමුණුම් ලිපිය පරිදි කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇමතූ 2021.05.05 දින දරණ ලිපිය මඟින් පැහැදිලිවේ. ඒ තනතුරු පුරප්පාඩු ඇතිවූ ආකාරය දින සහිතව සඳහන් කර ඇත. ඒ පිළිබඳව විවාදයක් නොමැත.

එසේ වුවත් අභියාචකවරු දන්වා සිටින්නේ මෙයට පෙර බඳවා ගැනීමේ 2019.03.25 දිනට පුරප්පාඩු 11ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබූ බවත්, ඒ අවස්ථාවේ සත්‍ය ලෙසම බඳවා ගනු ලැබුවේ 10 දෙනෙකු බවයි. සුදුසුකම් ලැබූ අය අතර 11 හා 12 අයදුම්කරුවන් සමාන ලකුණු ලබා තිබුණ බැවින්, ඒ අවස්ථාවේ 11 වැනි පුරප්පාඩුව පුරවා නැත. ඒ බැව් සනාථ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලේකම්, කම්කරු අමාත්‍යාංශයට යැවූ 2021.06.23 දින දරණ ලිපිය ඉදිරිපත් කර සිටී. ඒ ලිපියට අනුව 2021.08.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි III ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස් තනතුරු 10 දෙනෙකුට පිරිනමා ඇත. නාමලේඛනය අමුණා ඇත. මේ අනුව පසුගිය වාරයේ පුරප්පාඩු 11 තුළින් පුරවා ඇත්තේ, 10ක් බැවින්, සත්‍ය ලෙසට එක් පුරප්පාඩුවක් ඉතිරි වී ඇත. ඒ පුරප්පාඩුව මේ වසර සඳහා එකතු විය යුතු වුවත්, එය එකතුකර ඇති බවක් ලිපි ලේඛන අනුව සනාථ නොවේ.

මේ අනුව පුරප්පාඩු 11 නොව 12ක් විය යුතු බව අවිවාදයෙන් පිළිගත යුතුය.

මීළඟට අප බැලිය යුත්තේ, අනික් පුරප්පාඩුව ඇතිවූයේ කෙසේද යන්නයි. අභියාචකවරුන් දන්වා සිටින්නේ, කේ.එල්.සුබයිර් නැමැති III ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස්වරයා 2016.11.26 දින සිට II ශ්‍රේණියට උසස්කර ඇති නිසා, පුරප්පාඩුවක් ඇතිවූ බවයි. අදාළ සුබයිර් නැමැති අය තනතුරට උසස්කර ඇත්තේ, 2022.08.02 දින දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිය පරිදි පෙරදාතම් කිරීමක් සමගිනි. මෙම උසස්වීම් නිසා ඇතිවූ පුරප්පාඩුව 2017/2019 වසරේ පුරප්පාඩු වලට හෝ 2021/2023 යන අවස්ථා දෙක සඳහාත් ගණනය කර නැති බව දන්වා සිටී. අභියාචකවරුන් දන්වා සිටින්නේ, 2022.08.02 අදාළ පත්වීම් ලිපිය නිකුත් කළත්, 2016.11.26 දින සිට අදාළ අය මෙම තනතුරේ සේවය කරමින් සිටි බැවින්, එය පුරප්පාඩුවක් ලෙස ගණනය කළ යුතු බවයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇමතු කම්කරු අමාත්‍යාංශ ලේකම්ගේ 2024.03.15 දින (ඇමුණුම 06) ලිපිය අනුවද පැහැදිලිව මේ පිළිබඳව සඳහන් කර ඇත.

2021.03.31 දැන්වීම් ප්‍රසිද්ධය අනුව සූදානම් කළ විභාගය පවත්වා ඇත්තේ, 2023.01.28 දිනය. එසේම ඒ පිළිබඳව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත්තේ 2023.08.31 දිනය. පත්වීම් ලබා දී ඇත්තේ 2023.11.08 දිනය. දැන්වීම් ප්‍රසිද්ධ කර වසර 2 1/2 කට වැඩි කාලයක් ඒ සඳහා ගතවී ඇත. ඒ කාලය තුළදී අවශ්‍ය සේවක සංඛ්‍යාව නැවත සමාලෝචනය කර ඇත. අදාළ නිර්දේශ 2023.01.23 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇති අතර, 2023.02.07 දින අදාළ තීරණ අනුමතව ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ කම්කරු කොමසාරිස් තනතුරු 23ක් පුරප්පාඩුව පවතින බවට සහ 10ක් බඳවා ගැනීමට අනුමත කර ඇත. එම 10 ද අළුතින් බඳවා ගැනීම් ලෙස නොව, වෙනත් අමාත්‍යාංශ වල පවතින අතිරික්ත සේවක සංඛ්‍යා අතුරින් පුරවා ගැනීමට අනුමත කර ඇත. සහකාර කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තු තනතුරු 13ක් පුරප්පාඩු ලෙස දන්වා ඇති අතර, මෙම තනතුරු අභ්‍යන්තර උසස්වීම් මඟින් පුරවා ගැනීමට අනුමැතිය දී ඇත. අභ්‍යන්තර උසස්වීම් යනුවෙන් අදහස් වන්නේ දැනට සේවයේ සිටින අය අතුරින් නියමිත ක්‍රමවේදය භාවිතා කර, එම 13 දෙනා බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇති බවයි. අදාළ ලිපියට අනුව 13 දෙනෙකු බඳවා ගැනීමට පහසුකම් සළසා දී ඇති බව පෙනේ.

කෙසේ වෙතත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ පිළිබඳව තම අදහස් හා නිරීක්ෂණ 2025.01.07 දින සහ 2025.10.13 දින මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත. අදාළ ලේඛන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා සිටින්නේ,

භාණ්ඩාගාර චක්‍රලේඛ 02/2020 අනුව පුරප්පාඩු 11ක් පිරවීමට අනුමැතිය ලබා දී ඇති බවයි. අදාළ නිවේදනය 2021.11.01 දින ප්‍රසිද්ධ කර ඇත. නමුත් රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති තීරණයක් මත 2022.04.26 ජාතික අයවැය චක්‍රලේඛනය 3/2022 මගින් සියළු කටයුතු අවසන් කර තිබුණත් මේතාක් බඳවා ගැනීම් කර නැති පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කල් දමන ලෙසය. ඉන්පසුව රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටු නිර්දේශයන් අනුව කම්කරු අමාත්‍යාංශයේ ලේකම් පුරප්පාඩු 13ක් පිරවීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ නියමිත පුරප්පාඩු ප්‍රමාණයක් දක්වා නැති බවයි. එසේ වුවත් අදාළ ලිපිය අනුව පුරප්පාඩු 13 දෙපාර්තමේන්තු අභ්‍යන්තර උසස්වීම් මගින් පුරවා ගැනීමට අනුමැතිය දී ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව තම නිරීක්ෂණ ලිපියේ 7 ජේදය අනුව දක්වා සිටින්නේ, මෙම ලිඛිත විභාගය 2023.01.28 දින පවත්වා ඇති අතර, අදාළ අනුමැතිය ලබා දී ඇත්තේ ඊට පසුව බවයි. නමුත් අදාළ කමිටු වාර්තාව ඊට පෙර ලබා දි ඇති අතර, 2023.01.23 දින අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. ඊට 2023.02.07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මේ කටයුතු එකම දින වකවානුවක සිදුවී ඇති බව පැහැදිලිවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ වල 8 ජේදය යටතේ සුභාහිර් මහතාගේ උසස්වීම් පිළිබඳව සඳහන් කර ඇත. එම 2021.03.31 දිනට පුරප්පාඩුවක් ලෙස සැලකීම අපහසු බව දැන්වුවත් සත්‍ය ලෙසම මේ අනුව පුරප්පාඩුවක් අහිමි වී ඇති බව පෙනේ. අදාළ දිනය පිළිබඳව පමණක් ගැටලුවක් මතුවේ. කෙසේ වුවත් 2022.08.22 දින සිට පුරප්පාඩුව පවතින බවට සැළකිය හැකිය. අදාළ විභාගය පවත්වා ඇත්තේ 2023.01.28 හා සම්මුඛ පරීක්ෂණය 2023.08.01 දින පවත්වා ඇති අතර, ඊට පෙර අදාළ පුරප්පාඩුව පැවැති බවට ස්ථිර ලෙසම පෙන්වා දිය හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ වාර්තාවේ 10 ජේදය යටතේ මේ වන විට නව බඳවා ගැනීම් 19ක් සඳහා අයදුම්පත් කැඳවීමට අනුමැතිය ඉල්ලා තිබුණද, පුරප්පාඩු ගණනය කිරීම පිළිබඳව තොරතුරක් නොමැති නිසා මේතාක් අනුමැතිය ලබා දී නැත. මේ අනුව පැහැදිලි වන්නේ මේ වන විටත් පුරප්පාඩු 19ක් පවතින බවයි. එසේම අදාළ නිරීක්ෂණ වාර්තාවේ 12 ජේදය අනුව විභාග දෙපාර්තමේන්තුව කුසලතා අනුපිළිවෙල අනුව 11 දෙනෙකුගේ නාම ලේඛනයක් පමණක් එවා ඇති බව දන්වා සිටී. එසේ වුවත් අභියාචකවරුන් 2024.07.18 දින ඉදිරිපත් කරන ලද අභියාචනය සමඟ ඇමුණුම් VII ලෙස නාම ලේඛනය, නම් 48ක් සමග ඉදිරිපත් කර ඇත. එම ලේඛනයට අනුව අයදුම්කරුවන් 48

දෙනාගේ විභාග අංක සමඟ ලබාගත් ලකුණු ඉදිරිපත් කර සිටී. ඒ ලේඛනය අනුව අංක 01 සිට 10 දක්වා අයදුම්කරුවන් පිළිවෙලින් 261 – 222 දක්වා ලබාගෙන ඇත. එම නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත්වීම් ලබා දුන් නම් හා ගැලපේ. එසේම,

12 – ස්ථානයේ අභියාචක 1006 ආර්.ඒ.එස්.ඒ. පෙරේරා 221 ලකුණු

13– ස්ථානයේ අභියාචක 1062 ඩබ්.එල්.ඩී.එන්.විජේසුන්දර 218 ලකුණු ලබාගෙන සිටී. එය නිවැරදි බව පිළිගැනීමට සිදුවේ. 2024.03.15 දින දරණ කම්කරු අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ඇමතූ ලිපිය පරිදි එම අවස්ථාව වන විට පැවති පුරප්පාඩු 06ක් පුරවන ලෙස ඉල්ලා ඇත. කම්කරු දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරී හිඟය මත රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමේ දී ගැටලු ඇතිවී ඇති බවද දක්වා ඇත. 2024.02.20 දින කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ද එකී පුරප්පාඩු 02 එම විභාගයේ ප්‍රතිඵල මත පුරවන ලෙස කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මගින් ඉල්ලීමක් කර ඇත.

ඉහත සියලු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ, අදාළ අවස්ථාව වන විට සත්‍ය ලෙසම පුරප්පාඩු 13ක් තිබූ බවත්, එමෙන්ම එම පුරප්පාඩු 13ම පුරවන ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් සහ කම්කරු අමත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශ හා ඉල්ලීම් ද සිදුකර ඇති බවයි. මෙයට අමතරව මෙම පුරප්පාඩු වු තනතුරු 02 සඳහා පත්වීමට නියමිත නිලධාරීන් දෙදෙනා වන අභියාචකවරුන් අදාළ විභාගයේ ඊළඟට වැඩිම ලකුණු ලැබූ නිලධාරීන් දෙදෙනා වේ. එසේම මෙම දෙපාර්තමේන්තුවේ වසර 17 කට වඩා පළපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වේ. ඒ අනුව මෙම දෙදෙනාම අලුතින් බඳවා ගැනීමක් නොවන අතර, අභ්‍යන්තර උසස්වීම් මගින් තනතුරු පිරවීමකි. ඒ අනුව රජයට අමතර විශාල වැය බරක් දැරීමට සිදුවන්නේ ද නැත. දැනටමත් පුරප්පාඩු 19ක් හෝ ඊට ආසන්න ගණනක් පවතින බවට තොරතුරු පවතී. මෙම තනතුරු දෙක අදාළ අයට ලබාදීම නිසා වෙනත් පුද්ගලයෙකුට අගතියක් සිදුවන්නේ ද නැත.

ඉහත සියලු කරුණු සළකා බලා මෙම දෙදෙනාට 2023.11.08 දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ තනතුරු ලබාදීම සුදුසු බවට නිර්දේශ කරමු. එසේ වුවත් අදාළ අයවළුන් එම තනතුරේ රාජකාරී කටයුතු 2023.11.08 දින සිට සිදුකර නොමැති බැවින්, හිඟ වැටුප් හෝ දීමනා ගෙවීමකින් තොරව අදාළ දින සිට පත්වීම් ලබාදීම සිදුකිරීමට වැඩිදුරටත් නියෝග කරමු. සංශෝධනයට යටත්ව අභියාචනයට ඉඩ ලබා දී ඇත.

මෙම තීරණය අභියාචකවරුන්, ලේකම්, කම්කරු අමාත්‍යාංශය හා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

සංශෝධනයට යටත්ව ඉල්ලීමට ඉඩදී ඇත.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-